# බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලය, වේයන්ගොඩ

## 2022 ශිෂ්‍යත්ව විභාග ප්‍රතිපල මත 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කරගැනීම – 2023

## (ආදි ශිෂ්‍ය, සහෝදර හා කාර්ය මණ්ඩල පදනම )

වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විද්‍යාලයේ 6 ශ්‍රේණියට 2023 වර්ෂය සඳහා ආදි ශිෂ්‍ය / ශිෂ්‍ය සහෝදර/ අධ්‍යයන කාර්ය මණ්ඩල යන පදනම් මත 15% අනුග්‍රහය යටතේ පවතින පහත පුරප්පාඩු සංඛ්‍යාව සඳහා සිසුන් බඳවා ගැනීමට ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2008.09.19 දිනැති 2008/37 චක්‍රලේඛය සහ 2018.02.16 දිනැති 03/2018 චක්‍රලේඛ හා 2018.12.19 දිනැති 6 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේ ED/01/12/15/02/04 අංක දරණ උපදෙස් ලිපිය ප්‍රකාරව පහත සඳහන් පරිදි එක් එක් පදනම සඳහා සිසුන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

| පදනම | අනුග්‍රාහ ප්‍රතිශතය | බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| ආදි ශිෂ්‍ය | 5% | 15 |
| ක්‍රියාකාරී ආදි ශිෂ්‍ය | 2.5% | 8 |
| ශිෂ්‍ය සහෝදර | 5% | 15 |
| අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩල | 2.5% | 8 |

මේ සඳහා පහත සුදුසුකම් සපුරාලන ශිෂ්‍ය/ ශිෂ්‍යයාවන්ට අයදුම් කළ හැක.

1. 2022 වර්ෂයේ පැවති 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිට ගම්පහ දිස්ත්‍රික් අවම ලකුණු සීමාව වන ලකුණු 153ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගනිමින් සමත් වීම.
2. අවම වශයෙන් ආදි ශිෂ්‍ය / ශිෂ්‍ය සහෝදර / කාර්ය මණ්ඩල යන පදනම්වලින් එකකට අයත් වීම.
    - ආදි ශිෂ්‍ය පදනමින් අයදුම් කිරීම සඳහා අදාළ ශිෂ්‍යයාගේ මව හා/හෝ පියා මෙම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු/ ශිෂ්‍යාවක විය යුතුය.
    - ශිෂ්‍ය සහෝදර පදනමින් අයදුම් කිරීම සඳහා අදාළ ශිෂ්‍යයාගේ සහෝදර/ සහෝදරිය වර්ෂයකට වැඩි කාලයක සිට මෙම විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු/ ශිෂ්‍යයාවක විය යුතුය. 2022 වර්ෂයට අදාළව පැවැත්වූ අ.පො.ස. (උ/පෙළ) විභාගයට ප්‍රථම වරට පෙනී සිටි අයගේ බාල සහෝදර / සහෝදරියන්ට ද මේ සඳහා අයදුම් කළ හැකිය.
    - කාර්ය මණ්ඩල පදනමින් අයදුම් කළ හැක්කේ ගම්පහ අධ්‍යාපන කලාපය තුළ සේවය කරන පාසල් අධ්‍යාපනයට සෘජුව බලපාන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩල පිරිසගේ දරුවන්ට පමණි.

    ඉහත සියලු සුදුසුකම් සපුරාලන ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ට මෙයට අමුණා ඇති අයදුම්පත සම්පූර්ණ කර සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන ...... දින පහත සඳහන් වේලාවන්හි දී රැගෙන විත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ හැකිය.

- සහෝදර පදනම - පෙ.ව.8.00
- අධ්‍යයන කාර්ය මණ්ඩල පදනම - පෙ.ව. 9.00
- ආදි ශිෂ්‍ය පදනම - පෙ.ව.10.00

ඉහත සදහන් කරන ලද කාණ්ඩ එකකට වඩා වැඩි ප්‍රමාණයකට ඔබ අයත් වේ නම් ඊට අදාළව වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කරන්න.

සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේ දී පහත සඳහන් ලිපි ලේඛන රැගෙන ආ යුතුය.

- සිසුවාගේ ශිෂ්‍යත්ව ලකුණු සනාථ කිරීමේ ලේඛනය හා පිටපත
- සිසුවාගේ උප්පැන්න සහතිකය හා පිටපත
- ශිෂ්‍යයාගේ දෙමව්පියන්ගේ හැඳුනුම්පත් හා පිටපත්

එක් එක් පදනමට අදාළව ලැබෙන අයදුම්පත්‍ර ශිෂ්‍යත්ව ලකුණු අනුව පෙළගස්වා ඉහළ ලකුණු ලබාගත් ශිෂ්‍ය/ ශිෂ්‍යයාවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් අදාළ පුරප්පාඩු සඳහා බඳවාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබන්නේ ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට පමණක් බව කරුණාවෙන් සලකන්න.

ක්‍රියාකාරී ආදි ශිෂ්‍ය පදනම යටතේ සිසුන් තෝරාගැනීම පහත නිර්ණායක හා ලකුණුදීමේ පටිපාටිය මත සිදුකෙරේ.

| | නිර්ණායකය | උපරිම ලකුණු |
|---|---|---|
| 01 | ශිෂ්‍යත්ව විභාග ලකුණු | 200 |
| 02 | ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන නිලයක් දැරීම (ප්‍රධාන ලේකම්, උප සභාපති, උප ලේකම්, භාණ්ඩාගාරික) | 04 |
| 03 | ආදි ශිෂ්‍ය සංගමයේ විධායක කමිටු සාමාජිකත්වය දැරීම | 03 |
| 04 | ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය ( ශිෂ්‍යත්ව විභාගය පැවැත්වූ දිනට)<br>අවු. 01 – 03 (ලකුණු 01)<br>අවු. 03 – 05 (ලකුණු 02)<br>අවු. 05 ට වැඩි (ලකුණු 03) | 03 |
| 05 | පාසල වෙනුවෙන් ව්‍යාපෘති දායකත්වය | 03 |
| 06 | පොදු ව්‍යාපෘති දායකත්වය | 02 |
| | **මුළු ලකුණු** | **215** |

**අයදුම් පත්‍ර භාර ගැනීම 2023.04.10 දිනෙන් අවසන් වේ.**

ඔබගේ අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් ඔබ සතුව තබාගන්නා ලෙස උපදෙස් දෙනු ලැබේ. සියලු විමසීම් වලදී එය ඉදිරිපත් කළ යුතුය.